# එදා සිංහලයින් සිංහල භාෂාවට සැලකූ හැටි !

එදා වර්ෂය 1912 විය. එනම් දැනට අවුරුදු සීයකට පෙරය. ලංකාවේ පාලනය සුද්දාගේ විය. භාෂාව ඉංග්‍රීසි විය. ආණ්ඩුවේ පාසැල් වල මාධ්‍යය සිංහළ විය. රටේ බහුතර සංඛ්‍යාව සිංහළ උගත්තෝ වූහ. එහෙත් සිංහළෙන් ඉහළටම ඉගෙන ගත්තද කෙනෙකුට ලැබිය හැකි රැකියාව වූයේ එක්කෝ ස්වභාෂා හෙවත් සිංහළ ගුරුවරයෙකු වීමය, නැතහොත් සිංහළ වෙදෙක් වීමය.

එකල ඉංග්‍රීසි නොදත් අයට කාර්යාලයක පියන් වැඩක් වත් ලැබිය නොහැකි විය. ඉංග්‍රීසියෙන් අධ්‍යාපනය ප්‍රභූ පන්තියට පමණක් සීමා වූයේය. ඒ එය මුදල් ගෙවා ලබාගත යුතුවීමයි. ද්විතීයික අධ්‍යාපනයක් ලබාගත හැකිවූයේ ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණකි.

1910 දී ද්විතීය එනම් ඉංග්‍රීසි පාසැල් වල අධ්‍යාපනය පිළිබඳ සොයා බල යෝජනා ඉදිරිපත් කිරීමට මැක්ලොයිඩ් නමැති අයගේ ප්‍රධානත්වයෙන් 11 දෙනෙකුගෙන් සමන්විත කොමිසමක් රජය විසින් පත්කරන ලදී. මේ වන විට එංගලන්තය ඇතුළත් බටහිර ලෝකයේ පිළිගත් අධ්‍යාපන මූලධර්මයක් වූයේ ශිෂ්‍යයෙකුට මුල් කාලයේ අධ්‍යාපනය සිය මව්භාසාවෙන් ලබා දිය යුතුය යන්නය. මෙම සිද්ධාන්තය අනුව යමින් ඉංග්‍රීසි පාසැල් වලද ප්‍රාථමික අවස්ථාවේ ඉංග්‍රීසියෙන් පටන්ගැනීමට පෙර මුල් කාලයේ ස්වදේශී භාෂාවෙන් ඉගැන්වීම පිළිබඳව රටේ අදහස් විමසන ලදී.

සාක්ෂි දෙන්නට ආ සිංහළයින් 17 දෙනාගෙන් 11 දෙනෙක්ම සිංහළ භාෂාව විකල්ප විෂයක් වශයෙන් වත් ඉංග්‍රීසි පාසැලකට ඇතුල් කිරීම ගැන තදින් ම විරුද්ධ වූහ. ද්‍රවිඩ සාක්ෂිකරුවන් 10 දෙනාගෙන් 7 දෙනෙක්ම මුල් අවධියේ ස්වභාෂාවෙන් උගන්වා පසුව ඉංග්‍රීසිය ඇරඹීමට එකඟ වූහ. සිංහලුන්ට එදා සිංහළ යනු ආයා අප්පුගේ බාසාව විය. ගොඩයන්ගේ බාසාව විය. ඒ එදා අපේ සිංහළ අය හා ද්‍රවිඩ අය කටයුතු කළ ආකාරයයි.

එදා ඉංග්‍රීසි ජාතිකයෙකු ක්‍රියා කළ ආකාරය ගැනයි මේ.

ලංකාවේ වෙසෙන මිනිසුන් තුළ ඒ ආකාරයේ චිත්ත ස්වභාවයක් පැවතීම ගැන එවකට ගාල්ල මහින්ද විද්‍යාලයේ විදුහල්පති වූ අධ්‍යාපන විශේෂඥ, ඉංග්‍රීසි ජාතික එෆ්. එල්. වුඩ්වර්ඩ් මහතා මෙසේ පවසා ඇත.

" මව්බස ඉවත ලමින් ඉංග්‍රීසි ඉගෙනීම ලංකාවේ අධ්‍යාපනයේ පූජ්‍ය වස්තුවක් බවට පත්ව තිබේ. සිය ජීවනෝපාය සලසා ගැනීමට හා වාණිජ හා වෘත්තීය කටයුතු සඳහා බොහෝ දෙනෙකුට ඉංග්‍රීසි අවශ්‍ය බවට සැකයක් නැත. එසේම ඉංග්‍රීසි දැනුමක් නැතුව ලංකාවේ අපට නූතන සංස්කෘතීන් හා ශිෂ්ඨාචාරයන් පිළිබඳව ලෝකයේ මහා ප්‍රවාහයන් හා සම්බන්ධතා පවත්වන්නට හැකි නොවෙනු ඇත. එහෙත් පාසැල් වල මව්බස ඉවත ලෑමට හෝ, මව්බසින් වාක්‍ය දෙකක් හෝ නිවැරදිව කතාකිරීමට හෝ ලිවීමට හෝ නොහැකි වන තරමට අපේ තරුණ පිරිස මව්බස නොදැන වැඩිවියට පත්වීමට ඉඩහැරීම වැරදිය. එමගින් අපේ උගත් පන්තියට ඉංග්‍රීසි දැනුමක් ලබාගැන්මට කිසිම අවස්ථාවක් නොලබන සිය රටවැසි බහුතර සහෝදර පිරිස සමග සුහද සම්බන්ධතා පවත්වන්නට ඇති අවස්ථාවන් ඒ නිසා වළකී. ඔබගේ ජාතිය සඳහන් වී ඇති ඔබගේ භාෂාව කියවීමට ඔබට නොහැකි නම්, ඊට ජීවය දෙන භාෂාව කතාකිරීමට නොහැකි නම්, ඔබ ඔබේම රටේ ඔබේ ජනතාවම අතර පිටස්තරයෙකු වන්නේය. ඔබ හදාවඩා ගන්නට උත්සාහ ගන්නා ජාතිය ඔබ පිළිනොගන්නවා ඇත. එවිට ඔබගේම ජනතාවගෙන් ඔබ ඉබේම ඈත් වෙනවා ඇත........"

" අධිරාජ්‍යයන්හි දියුණුවට පත්වී තිබුණු ඒවායේ භාෂාවන්ද ශිෂටාචාරයන්ද සමග වැළලී ගොස් ඇති නමුදු පෙරදිග ලෝකය පාළි, සංස්කෘත, සිංහළ හා දෙමළ භාෂාවලින් ලියැවුණු විද්‍යා හා අධි භෞතික විද්‍යා හා සාහිත්‍යය ගැබ්වුණු වස්තුවකට හිමිකම් කියයි. සැබෑ ජීවිතයේ ප්‍රගති මාර්ගය සොයා යායුත්තේ මේ තුළිනි.

දෙවිවරුන්ට යම් පිරිසක් විනාශ කිරීමට අවශ්‍ය වෙයි නම් ඔවුන් මුලින්ම කරන්නේ ඒ අයට විතර්ක ඥානය අහිමිකිරීම ය.


මගේ අදහස නම් ආණ්ඩුව තුළ මහ ජනතාවගේ සැබෑ සුභසිද්ධිය පිළිබඳ හැඟීමක් තිබේ නම් එය සියළුම ඉංග්‍රීසි පාසැල්වල සිංහළ ඉගැන්වීම අනිවාර්ය කළයුතු බවයි........"

ඒ වසර 100 කට පෙර එදා ශ්‍රීලංකාව තුළදී ඉංග්‍රීසි ජාතික විද්වතෙකු කළ ප්‍රකාශයකි.

එදා සිංහළ බසට ලංකාවේ සිංහළයා සැලකූ හැටි පැහැදිලි වෙයි. එහෙත් අද එහි වෙනසක් වී ඇත්ද?

නැත! එදා මෙන්ම අදත් සිංහළයාට සිංහළ බසෙහි අගයක් ඇත්තේම නැත. අපේ රටේම එදාටත් වඩා අද ඉංග්‍රීසියට ගැතිවී තම මව් බසට නිගරුකරන හැටි අපි නිතර දකිමු.

♦ **වකුල ගුණපාල**
**Ilford Essex UK**



**ගාල්ල මහින්ද විද්‍යාලයේ විදුහල්පතිව සිටි එෆ්. එල්. වුඩ්වර්ඩ් මහතා**

**Mr F. L. Woodward**
**This photograph was taken when he was the principal of Mahinda College (1903 -1919) Galle, Sri Lanka.**

### ලේඛකයා ගැන.......

*වකුල ගුණපාල කොළඹ විශ්ව විද්‍යාලයේ විද්‍යා හා තාක්ෂණික අධ්‍යන අංශයේ හිටපු අංශ ප්‍රධානී වෙයි. පසුව ඔහු නයිජීරියාවේ මයිගුරී විශ්වවිද්‍යාලයේ සේවයට බැඳුණු අතර මෑතක එංගලන්තයේ උසස් විද්‍යාල කීපයකම ගණිත හා භෞතික විද්‍යා උපදේශකවරයෙකු ලෙස වසර ගණනාවක සේවයෙන් පසු දැන් විශ්‍රාම ලබා සිටී.*

## Frank Lee Woodward

Frank Lee Woodward, the principal of Mahinda College from 1903 to 1919.

Frank Lee Woodward (1871-1952) was born in Saham Toney in Norfolk, England, as the son of a vicar of the Anglican religion. He had an archetypal Victorian boyhood and attended a traditional English public school. He won a scholarship to Cambridge and later turned to teaching, which secured him a deputy headmastership. He joined the London Theosophical Society and was a great friend of Col. Henry Steel Olcott. Col.Olcott offered him the principalship of Mahinda College, which he accepted and nursed for 16 years.

He was the principal of Mahinda College from 1903 to 1919. Woodward's work at Mahinda College included taking classes in English, Latin, Pali, Buddhism and Art, in addition to the administrative duties associated with the position of principal of the school. With the assistance of Mudaliyar Gunaratne, Muhandiram Thomas Amarasuriya, Muhandiram Wickremasinghe and the benevolent Buddhist public, Mr. Woodward shifted the College to its present site and made it one of the leading colleges in the Southern Sri Lanka. His involvement went much further. He was the designer and architect of its buildings, personally supervised their construction, and often worked alongside with the masons.Mr. Woodward who has not only built buildings for Mahinda College gave it a soul - the Woodward tradition.

This was done through precept and practice. He decided to leave the college in 1919.He was the designer and architect of its buildings, personally supervised their construction, and often worked alongside with the masons.Mr. Woodward who has not only built buildings for Mahinda College gave it a soul - the Woodward tradition. This was done through precept and practice. He decided to leave the college in 1919.

Frank Lee Woodward spent his retirement in Rowella, Tasmania, translating Buddhist scriptures from Pali to English. A vegetarian, a mystic and a man of whimsy, he practiced yoga, wore a turban and lived alone, surrounded by Buddhist scriptures on thousands of palm-leaves. He has translated eighteen of the forty-two volumes of the Pali texts into English and compiled the vast concordance of the Pali canon, which occupied the last fifteen years of his life. He was an erudite Pali scholar and translator. Mr.Frank Lee Woodward died in 1952.

## සිංහළ භාෂාවට ලැදි වූ ඉංග්‍රීසි ජාතිකයා

fප්‍රෑන්ක් ලී වුඩ්වර්ඩ් ගාල්ල මහින්ද විද්‍යාලයේ 1903 - 1919 දක්වා සේවය කළ විදුහල්පතිවරයා ය.

ප්‍රෑන්ක් ලී වුඩ්වර්ඩ් (1871-1952) එංගලන්තයේ නෝර්පෝක් හි උපත ලද්දේය. ඔහුගේ පියා එංගලන්ත සභාවේ දේවගැතිවරයෙකි. වික්ටෝරියානු යුගයේ ප්‍රභූ ළමා කාලයක් ගෙවූ වුඩ්වර්ඩ් ඉංග්‍රීසි උසස් පාසැලක ඉගෙනුම ලැබීය. කේම්බ්‍රිජ් විශ්වවිද්‍යාලයට ශිෂ්‍යත්වයක් ලැබූ ඔහු ගුරු වෘත්තිය තෝරා ගත් අතර උප විදුහල්පතිවරයෙකු වීය.

ලන්ඩනයේ එකල අරඹා තිබුණු පරම විඥානාර්ථ සමාජයට බැඳුණු වුඩ්වර්ඩ්ට එහිදී කර්නල් හෙන්රි ස්ටීල් ඕල්කොට් හමුවිය. දෙදෙනා මිත්‍රයින් වීමේ ප්‍රථිපලයක් වශයෙන් ඕල්කොට් මහින්ද විද්‍යාලයේ විදුහල් ධූරය බාරගන්නා ලෙස වුඩ්වර්ඩ් ගෙන් ඉල්ලී ය. එය පිළිගත් වුඩ්වර්ඩ් වසර 16 ක් (1903 - 1919) මහින්ද විදුහලේ විදුහල්පතිවරයා වශයෙන් සේවය කළේ ය.

විදුහල්පති කාර්යයට අමතරව ඔහු පන්තිවලට ඉංග්‍රීසි, ලතින්, පාලි, බුදුදහම සහ චිත්‍රශිල්පය ද ඉගැන්වී ය.

මුදළිඳු ගුණරත්න, මුහන්දිරම් තෝමස් අමරසූරිය, මුහන්දිරම් වික්‍රමසිංහ යන දකුණේ සිංහළ ප්‍රභූවරු තිදෙනද, අවට ත්‍යාගිශීලී බෞද්ධ ජනතාවගේද ආධාර ඇතිව වුඩ්වර්ඩ් මහතා මහින්ද විද්‍යාලය අද පවතින ස්ථානයට ගෙනවුත් එය දකුණු පළාතේ මුල් පෙළේ උසස් විදුහලක් බවට පත්කළේය. එපමණක්ද නොව ඒ සඳහා ඔහුගේ කැපවීම තවත් ඉදිරියට ගෙන යමින් විදුහලේ ගෘහනිර්මාණ ශිල්පියාද ඔහුම විය. ගොඩනැගිලි ඉදිවන කල්හි ඔහු ඒ හැම අස්සක් මුල්ක්ම පරීක්ෂාකරමින්, වැඩකරන අයට ගුරුහරුකම් සහ විධානය දෙමින් පමණක් නොව, වැලි, ගඩොල්, සිමෙන්ති පවා අදිමින් ගොඩනැගිල්ල නිමකරන්නට දිවා රෑ නොබලා මහන්සියෙන් කටයුතු කළේය. වුඩ්වර්ඩ් මහතා එසේ මහින්ද විද්‍යාලය ඉදිකළා පමණක් නොව ඊට අවශ්‍ය ප්‍රාණයද ඒ ගොඩනැගිල්ට කැවූයේ ය. එය මහින්ද විදුහලටම අවේණික වුඩ්වර්ඩ් සම්ප්‍රදාය බවට පත්වූයේය.

එය තවමත් එසේ බව එහි ශිෂ්‍යයෝ අදත් වටහාගනිති. එනම් වෙනත් විදුහලක නැති අපූර්ව ගතියක් ගාල්ල මහින්ද විද්‍යාලයේ අදත් පවතී. වුඩ්වර්ඩ් මහතා 1919 දී විදුහලෙන් අස්වී ගියේ ය.

විශ්‍රාම යාමෙන් පසු ඔහු ඔස්ට්‍රේලියාවේ ටස්මේනියාවේ පදිංචියට ගිය අතර එහිදී බෞද්ධ පතපොත විශාල ප්‍රමාණයක් පාලිවලින් ඉංග්‍රීසියට හැරවූයේය. එළවළු පමණක් ආහාරයට ගනිමින් තලප්පාවක්ද බැඳ යෝගා අභ්‍යාසයන්හි දිනපතා යෙදුනේය. ඔහුගේ අවසාන වසර පහළොව ඔහු ගෙවූයේ ත්‍රිපිටක ධර්මය ඇතුළත් පතපොත පරිශීලනය කිරීමෙනි. ඔහු සතුව බුදුදහම අඩංගු තල්කොළ විශාල සංඛ්‍යාවක් ද නිවසේ වීය.

ප්‍රෑන්ක් ලී වුඩ්වර්ඩ් මහතා වයස 81 ක් ආයුවළඳා 1952 දී අභාවප්‍රාප්තවූයේ ය.


The No. 1 Agent to Sri Lanka
Holiday Air
A Travel Experience to Remember
Do not book your Air Ticket with any other travel agent until you speak to us!
Best Value Deals to Colombo

| Airline | Fare | Date |
|---|---|---|
| Royal Jordanian | £125 +Taxes | 16 Dec 2011 |
| Jet Airways | £145 +Taxes | 30 Sep 2011 |
| One way special fare | £317 Inclusive of taxes | 15 Sep 2011 |
| Etihad Airways | £212 +Taxes | 9 Dec 2011 |
| Oman Air | £300 +Taxes | 9 Dec 2011 |
| Qatar Airways | £305 +Taxes Baggage Allowance - 32kg | 9 Dec 2011 |
| Gulf Air | £219 +Taxes | 21 Oct 2011 |
| Kuwait Airways | £230 +Taxes | 1 Sep - 09 Dec 2011 |
| SriLankan | £300 +Taxes | 15 Sep 2011 |
| One way special fare | £230 +Taxes | 9 Dec 2011 |
| Special return Business Class offer to CMB — SriLankan | £1050 +Taxes | 29 Oct 2011 |

0208 440 0770 www.holidayair.com
96 High Street, Barnet, Herts EN5 5SN Open 6 days - Mon-Fri 9.00am-6.00pm, Sat 9.30am-5.30pm Closed- Sunday & Bank Holidays
IATA ATOL 9425 PROTECTED MCG
*Terms and Conditions Apply. Fares valid Except Easter period - 1st April - 15th April